කොළඹ විශ්වවිද්‍යාලය

සිංහල අධ්‍යයනාංශය

ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - 2018

# FND 1212 - සිංහල ලේඛන සම්ප්‍රදාය හා සන්නිවේදනය

(පැ දෙකයි)

ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.

---

1. **අමාවතුරේ** බස් වහර පිළිබඳව විචාරකයන් දැක්වූ මත සමාලෝචනය කොට ඒවායේ යුක්තියුක්තතාවවිභාග කරන්න.

2. එක්කෝ

   **පූජාවලියේ** ලේඛන රීතිය සකස් කර ගැනීමට ජන වහර කෙතෙක් දුරට උපයෝගී කර ගෙන තිබේදැයි විමසන්න.

   නැතහොත්

   "**සද්ධර්මරත්නාවලි** කතුවර ධර්මසේන හිමියෝ නිදහස් ලේඛන රීතියක් අනුගමනය කළහ". මේ අදහසට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

3. සිංහල භාෂාවේ ද්වීරූපතා තත්ත්වය නූතන සිංහල ලේඛන ව්‍යවහාරය කෙරේ බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න.

4. "නූතන සිංහලයේ වර්ධනයත් සමඟ ලේඛන රීති විවිධත්වයක් දක්නට ලැබිණ" සනිදර්ශනව විමසන්න.

5. පුවත්පත් බස් වහරේ දැකිය හැකි ලේඛන ප්‍රභේද පිළිබඳ විවරණයක් සපයන්න.

6. 'භාෂා රීති ප්‍රතිසංස්කරණය' යනු කුමක්දැයි පැහැදිලි කොට සිංහල බස් වහර සකස් කිරීමට **කුමාරතුංග මුනිදාස** මහතා සිදු කළ දායකත්වය සාකච්ඡා කරන්න.

(අ. පි. බ. )

7. සිංහල ලේඛන සම්ප්‍රදාය වෙනස් කිරීමට නූතන ලේඛකයන් දැරූ ප්‍රයත්නවල සාර්ථක - අසාර්ථකභාවය විමසන්න.

8. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> (03) පිළිබඳ සටහන් ලියන්න.

(අ ) බුත්සරණ ලේඛන රීතිය

(ආ) රාජාවලියේ බස් වහර

(ඇ) මාර්ටින් වික්‍රමසිංහගේ භාෂා රීතිය

(ඈ) අජිත් තිලකසේනගේ ' මැදි වහර'

(ඉ) මිශ්‍ර සිංහලය